# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2389/08 - 2024 ජුනි මස 18 වැනි අඟහරුවාදා - 2024.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

22 වන වගන්තිය යටතේ වන නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙන පැවරී ඇති බලතල ප්‍රකාර ව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මගින්,

i. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන *අති විශේෂ ගැසට්* නිවේදනවල පළ කරන ලද 2021 අංක 3 දරන නියෝගවල උපලේඛනයේ I කොටසෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ විගාමිකයෙක් විසින් ආරම්භක සංක්‍රමණික දීමනාව යටතේ සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ.ඩො. 100,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සීමා කරනු ලැබේ;

ii. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/34 දරන *අති විශේෂ ගැසට්* නිවේදනවල පළ කරන ලද 2021 අංක 1 දරන නියෝගවල (මෙහි මින්මතු "2021 අංක 1 දරන නියෝග" වශයෙන් හඳුන්වනු ලබන) උපලේඛනයේ I කොටසෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙක් විසින් විදේශයන්හි ආයෝජන සිදු කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා සිදු කරන පහත දක්වා ඇති ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටවනු ලැබේ:

(අ) පහත සඳහන් සුදුසුකම්ලත් ආයෝජකයන් විසින්, පහත 2 (i) ඡේදයෙහි අර්ථ දක්වා ඇති පරිදි විදේශයන්හි ව්‍යාපාර පුළුල් කිරීමේ අරමුණ සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක සාමාන්‍ය කොටස්වල සිදු කරනු ලබන ආයෝජන:

i. ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්, එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා, හෝ



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ii. ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොකළ සමාගම්, එ.ජ.ඩො. 150,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා හෝ ආසන්නතම මූල්‍ය වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව ආයෝජක සමාගමේ ශුද්ධ වත්කම්වලින් 20% කට සමාන හෝ එයට අඩු ප්‍රමාණයක් යන ප්‍රමාණවලින් කුමන හෝ අඩු ප්‍රමාණය දක්වා, හෝ

(ආ) ආයෝජක සමාගම විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබා ගන්නා ලද අවසරලත් විදේශ ව්‍යවහාර ණය මුදලකින් අදාළ ආයෝජනය සම්පූර්ණයෙන් ම මූල්‍යනය කිරීමට යටත් ව, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විසින්, විදේශයන්හි ව්‍යාපාර පුළුල් කිරීමේ අරමුණ සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක සාමාන්‍ය කොටස්වල සිදුකරනු ලබන ආයෝජන, හෝ

ඉහත (අ) සහ (ආ) ඡේද යටතේ සඳහන් කරන ලද ආයෝජන, පහත 2 (ii) ඡේදයෙහි අර්ථ දක්වා ඇති පරිදි කළඹ ආයෝජනවලින් සමන්විත නොවිය යුතුය. ආයෝජක සමාගම විසින් අදාළ ආයෝජනවල අරමුණ ව්‍යාපාර පුළුල් කිරීම බව සහ එවැනි ආයෝජන, කළඹ ආයෝජනවලින් සමන්විත නොවන බව, එම සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමට අපේක්ෂිත බලයලත් වෙළෙන්දන් හට තහවුරු කළ යුතුය.

(ඇ) පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත්කරන ලද නියෝගවලට අනුකූල ව, ආයෝජිත රටෙහි පාලිත සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදුකරන ලද ආයෝජනවලට අදාළ ව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා, සුදුසුකම්ලත් ආයෝජකයන් විසින් සිදුකරනු ලබන පසු කාලීන ආයෝජන, හෝ

(ඈ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගමක් විසින්, පහත 2 (iii) ඡේදයෙහි අර්ථ දක්වා ඇති පරිදි, විදේශීය කාර්යාල පිහිටුවීම සඳහා, එ.ජ.ඩො. 100,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සිදු කරනු ලබන ආයෝජන, හෝ

(ඉ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගමක් විසින්, පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කරන ලද නියෝගවලට අනුකූල ව, මෙම නියමය ක්‍රියාත්මක වන දිනයට පෙර පිහිටුවන ලද, පහත 2 (iii) ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි, විදේශීය කාර්යාල සඳහා, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා, සිදු කරනු ලබන ආයෝජන, හෝ

(ඊ) පහත 2 (iv) ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි, බලපත්‍රලාභී බැංකුවක් විසින්, බැංකු මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ අරමුණ සඳහා විදේශයන්හි පාලිත සමාගම්වල කොටස්වල සහ/හෝ විදේශීය කාර්යාලවල සිදු කරනු ලබන ආයෝජන, හෝ

(උ) සුදුසුකම්ලත් නේවාසික තනි පුද්ගලයෙකු විසින් සේවක කොටස් හිමිකම් සැලැසුම්/සේවක කොටස් වරණීය ක්‍රම යටතේ සිදු කරනු ලබන ආයෝජන.

iii. විදේශයන්හි ව්‍යාපාර පුළුල් කිරීමේ අරමුණ සඳහා, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ.ඩො. 200,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සීමා කරනු ලැබේ;

iv. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සීමා කරනු ලැබේ;

v. 2021 අංක 1 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන, එම ආයෝජන පහත දක්වා ඇති නිර්ණායකවලින් එකක් හෝ සපුරාලන අවස්ථාවල දී, එක් එක් ආයෝජනය මත පදනම්ව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පනතෙහි 7 වන වගන්තියේ 10 වන උප වගන්තිය ප්‍රකාර ව, සළකා බලනු ලැබේඃ

(අ) යෝජිත ආයෝජනය, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විසින්, විදේශයන්හි ව්‍යාපාර පුළුල් කිරීමේ අරමුණ සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක සාමාන්‍ය කොටස්වල සිදු කරන ආයෝජනයක් විය යුතු අතර එම ආයෝජනය, ආයෝජක සමාගම විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් ලබාගන්නා ලද අවසරලත් විදේශ ව්‍යවහාර ණය මුදලකින් සම්පූර්ණයෙන්ම මූල්‍යනය කළ යුතු අතර කළඹ ආයෝජනයක් නොවිය යුතුය.

(ආ) යෝජිත ආයෝජනය, පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කරන ලද නියෝගවලට අනුකූල ව, ආයෝජිත රටෙහි පාලිත සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදුකරන ලද ආයෝජනවලට අදාළ ව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතා හෝ සපුරාලීම සඳහා, සුදුසුකම්ලත් ආයෝජකයන් විසින් සිදු කරන ආයෝජනයක් විය යුතුය.

2. මෙම නියමයෙහි අරමුණු සඳහා,

i. "ව්‍යාපාර පුළුල් කිරීම" යන්නෙන්,

(අ) දැනට පවතින නිෂ්පාදන හෝ දැනට සපයන සේවාවලට ඍජුවම සම්බන්ධ වන ක්‍රියාකාරකම් පුළුල් කිරීම. නිෂ්පාදන/සේවා සැපයීමේ ධාරිතාව වැඩි කිරීම හෝ දැනට පවතින නිෂ්පාදන හෝ දැනට සපයන සේවාවල පරාසය පුළුල් කිරීම මෙයට ඇතුළත් වේ, සහ/හෝ

(ආ) සැපයුම් දාමය හරහා ක්‍රියාකාරකම් "සිරස්ව ඒකාබද්ධ කිරීම්". මෙයට,

i. දැනට පවතින නිෂ්පාදන හෝ දැනට සපයන සේවා සඳහා භාවිතා වන අමුද්‍රව්‍ය හෝ සංරචක සපයාගැනීමේ කාර්යයන්ට ඍජුවම සම්බන්ධ වන ක්‍රියාකාරකම් සහිත "පසුපසට ඒකාබද්ධ කිරීම්" සහ/හෝ

ii. දැනට පවතින නිෂ්පාදන හෝ දැනට සපයන සේවා, අලෙවිකරණය, සිල්ලර වෙළඳාම ඇතුළු ව බෙදාහැරීම් සඳහා ඍජුවම සම්බන්ධ වන ක්‍රියාකාරකම්වලට සීමා වෙමින් අවසාන පාරිභෝගිකයාට වඩා සමීප ආයතන අත්පත් කරගැනීම හෝ එම ආයතනවල පාලනය ස්ථාපිත කිරීම සඳහා සම්බන්ධ වන ක්‍රියාකාරකම් සහිත "ඉදිරිපස ඒකාබද්ධ කිරීම්",

යන අයිතමයන්ගෙන් එකක් හෝ ඇතුළත් වේ.

ii. "කළඹ ආයෝජන" යන්නෙන්, සුදුසුකම්ලත් ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක සිදු කරන, එම ආයෝජකයන්ට, අදාළ සමාගමේ ඡන්ද බලයෙන් සියයට 10 කට අඩු ප්‍රතිශතයකට හිමිකම ලැබෙන පරිදි සිදුකරන ආයෝජන, අදහස් වේ.

iii. "විදේශ කාර්යාල" යන්නෙන්, විදේශ රටක පිහිටුවා ඇති ශාඛා, සම්බන්ධීකරණ කාර්යාල, අලෙවිකරණ කාර්යාල, අනුයෝජිත කාර්යාල, ව්‍යාපෘති කාර්යාල, නියෝජිත කාර්යාල හෝ වෙනත් ඒ හා සමාන කාර්යාල, අදහස් වේ.

iv. "බලපත්‍රලාභී බැංකුවක්" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථ දක්වා ඇති පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්, අදහස් වේ.

3. මෙම නියමය 2024 ජූනි 20 දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ. 2023 දෙසැම්බර් 20 දිනැති අංක 2363/26 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළකරන ලද නියමය මෙමගින් අවලංගු කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ජූනි 18 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0140

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.